

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 මැදින් මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 මාර්තු මස 26 වන දා** | **11 වන කලබ** |

# ලක් මවු පැතුම



දම්පල් විරු හඬ පණ ගන්වන්නට
බස - රැස - දෙස හා සසුන නඟන්නට
එන්න පුතුනි හෙළ එඩිය නඟා
පෙරට එන්න තව නො වී පමා

දැය ම අවදි කළ කාහල නාදය
එදා දැයට ගෙන දුන් ආලෝකය
ඔබේ හදින් පණ ගැන්වෙන තුරු පුත
ලක් මව පෙර මඟ බලා සිටී

**- අනඳ**



# අන්ධානුකරණය

බද්දේගම ශ්‍රී රත්නසාර පරිවේණාධිපතිව වැඩවිසූ
**පණ්ඩිත පූජ්‍ය ගණේගම සරණංකර නාහිමිපාණන් වහන්සේ විසිනි.**

අත්වැල ගත්තහු අනුව යන අන්ධයකු සේ නො සිතා නො බලා කරන අනුව යෑම අන්ධානුකරණය යි. මනුෂ්‍යයා වනාහි අනුකරණයේ මූර්තියක් හා ප්‍රතිඵලයක් ද වේ. එය ඔහුට සහජයෙන් ලැබුණු දායාදයකි. ළදරුවා අනිකකු කථාකරනු දක කථා කරන්නට පුරුදු වෙයි. මෙසේ හේ වැඩිහිටියන්ගේ භාෂාව කථාකරයි. ඔවුන් කියන දෙය කියයි. ඔවුන් කරන දෙය කරයි. ළමයි අනික් ළමයින්ගේ ආශ්‍රයෙන් ඔවුන් අනුගමනය කරත්. නූගතෙක් උගතෙකු අනුව යයි. දුප්පතා පොහොසතා අනුව යයි. ශිෂ්‍යයා ගුරුවරයා අනුව යයි. ජාතියක් තවත් ජාතියක් අනුව යයි. මේ අයුරින් අනුකරණය මිනිසාගේ සියලු ක්‍රියාවන්හි බල පවත්වයි.

නුවණ මෙහෙයා කරන අනුකරණයෙහි හොඳ ප්‍රතිඵල ඇත්තේ ය. එහෙත් අන්ධානුකරණයෙහි ඇත්තේ නරක ප්‍රතිඵලයි. ඇතැම් මිනිස්සු පැරණි වූ සියල්ල ම හොඳ යයි සලකති. එය ද අන්ධානුකරණයකි. පැරණි සිරිත් විරිත්වල ද කාලයට නොගැළපෙන සත්‍යයෙන් ඇත් වූ දියුණුවට

බාධක වූ සිරිත් විරිත් ද මිත්‍යා විශ්වාස හා ඇදහීම් ක්‍රම ද තිබිය හැකි ය. පුරාණයෙහි විසූ සියල්ලන් ම සිල්වත් ගුණවත් දක්ෂ අය ලෙස ඇතැම්හු සලකති. සිල්වත්තු පුරාණයේ ද විසූහ. දැනුදු වසත්. ගුණවත්හු එකල ද වූ හ. දැනුදු සිටිත්. එසේ ම සිල් නැත්තෝත් අදක්ෂයෝත් පෙරකල ද විසූහ. දැනුදු සිටිත්. එබැවින් පැරණි වූ තරමට සියල්ල යහපත් නොවේ. එසේ ම නවීන වූ තරමට ද සියල්ල යහපත් නොවේ. පැරණි වූ ද නවීන වූ ද කොයි කාලයේත් හොඳ නරක දෙක ම දක්නට ඇත. හොඳ දෙයින් ම පිරුණු කාලයක් හෝ නරක දෙයින් ම පිරුණු කාලයක් හෝ කිසි ම කාලයක විද්‍යමාන නොවිය හැකි බැවිනි. පුරාණ සිරිත් විරිත් නරක නම් පැරණිකම ගැන නො සලකා වහා ම හළ යුතුය. නවීන සිරිත් විරිත් වුවත් අයහපත් නම් නවීනකම ගැන නොසලකා වහා ම ඒවා අත්හළ යුත්තේ ය. එබැවින් කවුරුන් විසින් වුවත් අනුග මනය කළයුත්තේ නුවණින් සිතා බලා පරීක්ෂාකාරී ව ය. එසේ නො කරන්නාගේ අනුකරණය අන්ධානුකරණයෙහි ලා ගැණේ.

අන්ධානුකරණය නොයෙක් රටවල් හා ජාතීන්ගේ පිරිහීමට හේතු වී තිබේ. සියලු ම ආගම් අදහන්නන් අතර මිත්‍යා විශ්වාසයන්හි එල්බ ගත්තෝ සිටිත්. නිදහස් ව සිතීමට ඇතැම් අය ආගම බාධක කර ගනිත්. ශාස්තෘවරයාගේ දේශනාවට පූජකයාගේ දේශනාවට පොතෙහි එන කරුණුවලට වෙනස් ව සිතුවොත් තර්ක කළොත් සාපයන පාපයකැයි සිතන්නෝ එමට සිටිත්. රටට හිතකර නොවේ නම් කාලයට නො ගැළපේ නම් ජීවත්වීමට බාධක නම් සත්‍යට වෙනස් නම් ඵල රහිත නම්

නැණවතුන්ගේ පරිහාසයට ඉලක්ක වේ නම් කවරෙකු කීවත් කුමක් ලියා තිබුණත් එය හළ යුත්තේ ය. දියුණුවට හිතකර නම් කාලයට ගැළපේ නම් සඵල නම් සත්‍ය නම් නැණවතුන් විසින් ගරුකරනු ලැබේ නම් එය කවරෙකු කියා තිබුණත් කුමක ලියා තිබුණත් පිළිගත යුත්තේය.

පිරිහුණු ජාතියක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි අන්ධානුකරණය. මෑත භාගයෙහි ලාංකිකයා අන්ධානුකරණයෙහි දැඩි සේ එල්බ ගත්තකු ලෙස ප්‍රකට ය. පෘතුගීසීන් මෙහි පැමිණි විට ඇතැම්හු ඔවුන්ගේ ක්‍රියා අනුකරණය කළ හ. සමහරු ඔවුන්ගේ ආගම පිළිගත් හ. තවත් සමහරු ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් ගති සිරිත් පිළිගත් හ.සමහරු ස්වකීය පරම්පරාගත ව පැවති නම් ගම් පෙළපත් වෙනස් කොට ප්‍රනාන්දු, සොයිසා, ෆොන්සේකා, මැන්දිස්, ද සිල්වා යන නම් ව්‍යවහාර කළ හ. මේ නම් ගෝව ජාතිකයන් හෝ යුරෝපියන්වරුන් හෝ හැර භාවිත කරන පෙරදිග එක ම ජාතිය සිංහල ජාතියයි. නානාවිධ ජාතිවලට අයත් මිනිසුන් ඔවුන්ගේ ජාතියට අයත් නම කී කල ඔවුහු කුමන ජාතියකට අයත් වූවෝ දැයි හඳුනාගත හැකි වෙත්. දොරේසාමි කී කල ද්‍රවිඩයකු බවත් මොහොමඩ් අලී කී කල මුස්ලිම් කාරයකු බවත් ටෝජෝ යි කී කල ජපනකු බවත් කායිෂෙක් කී කල චීනකු බවත් දත හැකිය. එහෙත් නමින් පමණක් සිංහලයකු කෙසේ හැඳිනිය හැක්කේ ද ? ප්‍රතිකාල් ඕලන්ද ප්‍රංශ ඉතාලි හා ඉංග්‍රිසි නම් භාවිත කරන ලාංකික සිංහලයෝ හා ද්‍රවිඩයෝ ස්වකීය සභ්‍යත්වයට කැළල් කරන්නෝ වෙත්. කරුණු හරිහැටි තේරුණායින් පසුත් වරද දූන දූන මේ වනතුරු සමහරුන් විදේශීය නම් වෙනස් නොකර සිටීම ඔවුන්ගේ

දූන උගත් කමට ආත්ම ගෞරවයට මහත් මදිකමකි. ඔව්හු ස්වකීය වූ සභ්‍යත්වයක් ස්වකීය වූ ශිෂ්ටාචාරයක් ඇතැයි සලකන්නෝ වත් එයට ගරු කරන්නෝ වත් නොවෙත්. විදේශීය නාම භාවිතය සුළුකොට තැකිය යුතු වරදක් නොවේ. මෙසේ කිරීම අවුරුදු දෙදහසක් පැරණි වූ වැදගත් ශිෂ්ටාචාරයක් ඇති ජාතියක් ලැජ්ජා වියයුතු කරුණකි. ලෝකයෙහි අන්‍ය ජාතියකට අයත් කිසිවෙක් සිංහල නම් භාවිත නො කරත් නම් සිංහලයන් යුරෝපීය නම් භාවිතයෙහි ඇති තේරුම කිම ? එයින් අපට ලැබුණ ගෞරවය කිම ? මෙය විදේශිකයන්ගේ පරිහාසයට අප ලක්වන දෙයක් නොවේ ද ?

යුරෝපයේ ඇඳුම් පැළඳුම් ක්‍රම හා ඇතැම් සිරිත් විරිත් බිහි වී සුමානයක් ගතවෙන්නට මත්තෙන් එයට සැතපුම් සහස් ගණනක් දුරස් ව පිහිටි ලක්දිව ද ඒවා තිබෙනු දැක්ක හැකි ය. අනුකරණය මෙරටෙහි ශීඝ්‍ර ලෙස ගමන් කරන බවට නාගරික තරුණයන්ගේ මුහුණේ රැවුල හොඳ සාක්ෂියකි. අගනුවර ප්‍රසිද්ධ සභාවක රැස්ව සිටි පිරිස අතර රැවුල කැපීම, වැඩීම හා වෙනස්කිරීම ක්‍රම එකොළොසකට සිදුකරනු ලැබූ මුහුණු මට දක්ක හැකි විය. ස්ත්‍රීන්ගේ ඇඳුමේ වේගවත් වීම සාරිය නිසා යම් තම් නැවතිණි. දූනට වෙනස්වන්නේ සාරිය ඇඳීමේ ක්‍රම පමණකි. මෙරට මෙකල පවත්නා ගොඩනැගිලි අතර එක් ගොඩනැගිල්ලක ග්‍රීක රෝම ඉන්දියානු ආදී ගෘහ නිර්මාණ ක්‍රම හත අට බැගින් තිබෙන බව ගෘහ නිර්මාණ ශිල්පියෝ කියත්.

පිට රැටියන්ගේ වුවත් හොඳ සිරිත් විරිත් ගත යුතු ය. එහෙත් ඔවුන්ගේ සියලු ම සිරිත් විරිත් හොඳ යයි සර්ව

සම්පූර්ණ ලෙස නො ගත යුතු ය. ස්වජාතිකයිගේ වුවත් නරක සිතත් විරිත් හළ යුතු ය. ස්වජාතික වූ තරමට සියලු ම සිරිත් විරිත් යහපත් නොවේ. එහෙත් හැම ජාතීන් අතර ඒ ඒ ජාතිවලට ආවේනික වූ යහපත් සිරිත් ඇත්තේ ය. අන්ධානුකරණයෙන් පිටරැටියන් අනුව ගොස් ඒ උතුම් සිරිත් විරිත් අතහැර දැමීම විනාශදායක ය. ආත්ම ගෞරවයට නිගාදෙන නිර්මාණ ශක්තිය නැතිකරන ප්‍රෞඪත්වය වනසාදමන මේ අන්ධානුකරණය වහා ම අත් හළ යුතු ය.

''පඤ්ඤාදානුයාතං විරියං වදන්ති
සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං''
හත්ථවනගල්ලවිහාරවංසය

ප්‍රඥාව අනුව ගිය වීර්යය සියලු අර්ථ සිද්ධිය සලසා දෙන උතුම් අත යැයි කියති.



# “අසේවනා ච බාලානං පණ්ඩිතානං ච සේවනා”

වජිරාරාමවාසී ව වැඩ විසූ
**පූජ්‍ය පඹුරන මෙත්තෙය්‍ය ස්වාමීන් වහන්සේ විසිනි.**

''බාලයන් සේවනය නොකරව'' පින්වත් දරුවන්ට බුදුපියාණන් ගේ මහඟු අවවාදයක් මතක් කරමි. බුදුපියාණන් ගෙන් වෙන් ව මටවත් මාගේ දරුවන්ටවත් කිසි ම සැපතක් නොමැත. අමා වගුරවන දහමෙන් වෙන්ව සැපතක් නොමැත.

මෙලොව දියුණුව, මෙලොව සැපත සලසා දෙන පරලොව සැපත ළංකරදෙන ඒ අවවාදය කිසි දිනකත් අමතක නොකරනු. දිවි යතත් අත් නොහරිනු. ලෙඩ ඇඳේදීත් සිහි කරනු. මර ඇඳේදීත් සිහි කරනු. නිවනට බසිනතුරු ඊටම ලැදිවෙනු. ඊට ම ගැතිවෙනු.

මා අනුගමනය කරන මා ප්‍රිය දරුවෙනි, අමා මෑණියන් ගෙ ඒ මහඟු අවවාදය කරන තෙක්ම සිත සැනසෙයි. ඇසින් බලත් ම සිත සැනසෙයි. සිතත් ම සිත පිනායයි. ප්‍රීති රසය සියලු සිරුරෙන් උතුරා යයි.

සුවිනීත දරුවෙනි, බාලයාගෙන් වෙන්ව වසන්නාහු ද? කිමෙක් ද දරුවෙනි, බාලයා අඳුනන්නාහු ද,බාලයාගේ

ලක්‍ෂණ බුදු පියාණන් වහන්සේ වදාළ බව නොදන්නාහු ද? බාලයා සමඟ සහවාසයෙන් සිදුවන විපත නුදුටුවහු ද?

බාලයා අගුණයකි. බාලයා දුශ්ශීලයෙකි. බාලයාගේ සිතෙහි නපුරු සිතිවිලි ම උපදී. බාලයාගේ කය ඒ නපුරු සිතිවිලිවලට සේවය කරයි. බාලයා චපලයෙකි. දුකින් පිරීගිය සංසාරය සැපයෙන් පිරි අමාවක් ලෙස සලකන්නාත් බාලයෙකි. යහපත් අවවාද නො පිළිග න්නාත් බාලයකි. මම ය, මාගේ ය, මට ය යන මමත්වය සලකන්නාත් බාලයෙකි. සාරයෙහි අසාරය ද අසාරයෙහි සාරය ද සොයන්නාත් බාලයෙකි. මෙලෝ පරලොව වැඩ අවැඩ නො දන්නාත් බාලයෙකි. ''කරන කලට පව් මීරිය මී සේ'' පවෙහි ගැලී සතුටුවන්නාත් බාලයෙකි. ''එකස්ස චරිතං සෙයෝ - නත්ථි බාලෙ සහායතා'' සුපින්වත් දරුවෙනි, සදහට ම බාලයාගෙන් වෙන්වෙමු. බාලයාගෙ න් වෙන්ව වසන මාගේ දරුවන්ට කිසි දිනකත් විපතක් ළඟා නොවේ. නුවණ මුහුකුරා යයි. නිවන ළංවේ. මාරයා ඈත්ව කෙලෙස් මාරයාට පහරදීම.

බාලයා ගුරුන් නොතකයි. ගුරුන් සිත් රිදවයි. ගුරුන් අනුව නොයයි. කාරුණික ජේසුතුමා සතුරන්ට පාවා දුන්නේ පුතෙකුමෙන් ඇති දැඩි කරන ලද යුදාස් නම් ගෝලයෙක්ල. දුකසේ අඳ මව්පියන් රකිමින් මහලුවියෙහි සිටි ගුත්තිල පඬිතුමා වෙහෙසට පත් කලේ මූසිල නම් ගෝලයෙක්ල. යසලාලකතිස්ස දයාවන්ත රජතුමාට මිත්‍රද්‍රෝහි සුභ දොරටු පාලයා කළ ව්‍යසනය මතකද? සංඝමිත්‍ර ඇසුරු කළ මහසෙන් රජතුමාට කිසි ම සේනාවක් නැති විය. අමරණීය නමක් ඇති කළ

මින්නේරිය දෙවියන්ට අමරණීය කැලලක් උපන. ''**පූති මච්ඡං කුසග්ගෙන - යො නරො උපනය්හති - කුසාපි පූති වායති එවං බාලූපසේවනා.**'' දරුව, අප බුදුපියාණන් ගේ දයාබර මුව පියුමෙන් වහනය වූ අමා දහරක් බඳු උපදෙස සිහි කරව. කුසතණ සුවඳ ම ය. සඳුන් සේ සුවඳ ය. කුණු මස් දුගඳ ම ය. කිඩාරන් මල සේ දුගඳ ය. සුවඳ කුස තණ දුගඳ කුනුමස් දැවටීමෙන් දුගඳවිය.

**දුගඳ කුණුමස සුවඳ වී ද?**

යහපතට ගැති වූ දරුවෙනි, බාලයා අඳුනන්නහුද? බාලයා කෙළෙහි ගුණ නොදනී. අනුන් දුක නොදනී. අනුන් සැප නො ඉවසයි. අනුන්ට විපතක් පතයි. දේවදත්තයා නිසා පින්වත් අජාසත්ගෙන් සොවාන් ඵල දුරු විය. කෙලෙස් මරුට වසඟ විය. පියාට වධකයෙක් විය. පියාගේ කෝමල පතුල පැළී ය. ලුණු බහාලීය. ගින්නෙන් පිලිස්සී ය. ලේ ගලද්දී සක්මන් කරවී ය. සාදුකින් වෙහෙසී ය. පියගුණ නොතැකී ය. වධදී මැරවී ය. මහධන සිටු පුතු ගැන කියනු කිම බාලයා බාලයෙකි. ඔහුගේ නුවණැස පාදනු.

බාලයාගෙන් වෙන්වූ මාගේ දරුවන්ට උපන් ප්‍රීතියක මහත, මාගේ දරුවෝ බාලයන්ට අනුකම්පා කරති. මට වූ ලාභයක මහත !

දරුවෙනි, අකිත්ති පණ්ඩිතයන්ගේ කියමනක විලාසය බලව්. ''**බාලානපස්සේ න සුණෙ - න ච බාලෙන සංවසෙ, - බාලානල්ලාප සල්ලාපං න කරෙ න ච රොචයෙ,** පින්වත් දරුවෙනි, බාලයකු මොහොතකටවත් නොදකිම්වා,

බාලයකු පිළිබඳ පුවතකුදු නො අසම්වා, බාලයෙකු සමඟ පිළිසඳර කථාවකුදු නොවේවා, බාලයෙකු කිසි කලෙකුදු රුචි නොවේවා.

මංගල්‍ය කුමක්දැයි දැන ගැනීමට මිනිසුන් අතර මහත් විවාදයක් පැන නැංගේ ය. දෙව්ලොව දක්වා මේ ඝෝෂය නැංගේ ය. දේවතා කෙනෙකු විසින් බුදුපියාණන් අතින් ජේතවනාරාමයේ දී මංගල කාරණා ඇසීල. දරුවෙනි, අසේවනා ච බාලානං යනුවෙන් මාගේ පිය වූ දම්රදුන් මහත්සේ බාලයන් ඇසුරු නොකරන ලෙස දුන් අවවාදය ප්‍රිය දරුවන්ට ද දෙමි. පියාණන් වහන්සේ ගේ දෙයක් කීවෙමි.

### පණ්ඩිතානං ච සේවනා

මාගේ පින්වත් දරුවෝ පණ්ඩිතයන් සේවනය කරති. පණ්ඩිත චරිත කියවති. බාලයන් කෙරෙන් වෙන්වෙති. පඬුවන් ගිය මඟ සිතා සොම්නස් වෙති. ඒ උදාර ජීවිත අනුගමනය කරති. පණ්ඩිතයන් දැකීම මාගේ දරුවන්ගේ නෙතට රසඳුනෙකි. යහමඟ උගත් මාගේ දරුවො ආර්ය ගුරුවරුන් පුදති. සත්පුරුෂයන්ගෙ වචන දරුවන්ට අමා වැගිරීමකි. අමා ගීයකි. මාගේ දරුවෝ පණ්ඩිතයන් ගියමග දනිති. දරුව ඔබ ළමා ආර්යයෙකි. සිල්වතෙකි. අංකුර පණ්ඩිතයෙකි. නිවන සොයා යන්නෙකි. අතරමඟ නතර නොවන්නෙකි. මා ප්‍රිය දුවත් ලෞකික පණ්ඩිතයන් අඳුනයි. ලොකොත්තර සත්පුරුෂයන් නමදියි.

සත්පුරුෂයා අවවාද නිතර මෙනෙහි කරයි. දරුවෙනි, කුමක් සඳහා වීර්යකරමෝද? පඤ්චස්කන්ධය සැරසීමට

මාගේ දරුවෝ වැයම් නො කෙරෙති. දරුවනි, සුසිරිත් මැඩලීමට මාරයාට ඉඩ නොතබමු. දුසිරිතට නිගා කරමු. මාගේ දරුවන් ගේ චරිත නිර්මල ය. ආර්යයන්ට ම ගෝචර ය. ආර්ය දරුවෝ සතුන් නොමරති. නොමරවති. සතුන්ට හිංසා පිඩා නොකරති. සතුන්ට කරුණා කරති. දුකින් මුදවති. මස්රස නො දනිති. සොරකම් නො කරති. නො කරවති. සොරාට උපකාර නො කරවති. ඔත්තු නො කියති. හොරබඩු නො ගනිති. මාගේ දරුවෝ පතිවත රකිති. රාගාවිෂ්ටව පියවර තැබීම මාගේ දරුවන්ට විහිළුවකි. පිළිකුලකි. පවුල් අවුල් කිරීම දරුවෝ සිහිනයකි. පණ්ඩිත දරුවෙනි ගිහිගෙය ගිනිගෙයකි. මාගේ දරුවෝ සිහිනුවණින් යෙදී ගිහිගෙයි වෙසෙති. ගිහි සැපතෙහි ලොල් වී ගිජු නො වෙති. පින්වත් දරුවෙනි, ආත්මගෞරවය තහවරු කරමු. දරුව '' යෞවන මදයෙන් උමතු නොවව'' යන බුදු පියාණන් වහන්සේ ගේ අවවාදය මොහොතක් පාසා මෙනෙහි කරව. මාගේ දරුවෝ ඉසුරුමත් කමින් අන්ධව දුසිරිතෙහි නොගැලෙති. පණ්ඩිත දුව ද ලාමක දෙයෙහි නො ඇලෙන්නී ය. ආර්ය පුතාට තමන් නාඳුනන දූරිය ද එක කුස ඔත් සොයුරියකි.

**''මයං ච භරියා නාතික්කමාම**
**අම්හෙ ච භරියා නාතික්කමන්ති''**

සිය බිරින්දන් ඉක්ම නොයමු. බිරින්දෝ ද සැමියන් නො ඉක්මවති. පින්වත් දුව පණ්ඩිතයන් ආශ්‍රය කිරීම නො ඉක්මවති. පින්වත් දුව පණ්ඩිතයන් ආශ්‍රය කිරීම වටිනාකම බලව. සිත කය වචනය සුසිරිතට යටත්කල මාගේ පණ්ඩිත දරුවෙනි, බුදුපියාණන් වහන්සේ ගේ සියලු ප්‍රශංසාව අප වෙත ය.

සචෙ මෙ අංගමංගානි කාමජෙප්ජස බ්‍රාහ්මණ ? යනුවෙන් සිය සැමියා ඇමතුවේ ආර්ය දුවක විසින් බව මාගේ දරුවෝ දනිති.

මාගේ දරුවෝ නිරෝගී වෙති. දක්‍ෂ කටයුත්තෝ ය. දරුවෙනි, කිසිදිනක කෝපගින්නෙන් නැගුණු කලහ දුමෙන් ගෙය කිලිටි නො කරව. ශාන්ත ශ්‍රී පතුරවමු. මාගේ දරුවන්ට භාග්‍ය සම්පන්න පරපුරක් උදාවේ. ලෝකයේ යම්තාක් පණ්ඩිතයෝ ද ඒ සියල්ලන්ටම මාගේ දරුවෝ නෑකම් කියති. මාගේ දරුවන් බොරු සාක්කි නොකියන බව ඇයි මාරය තෝ නොදන්නෙහි ද? කැත වචනයක් කවදා පිටවුණි ද? අමිහිරි බසක් මාගේ දරුවෙකු නොකීබව අමතක ද? කඩපිල්වල හන්දිවල අලසයන්ගෙන් පිරිවැරූ තාවකාලික නිසරු සමාගම්වලට පැමිණෙන අය මාගේ දරුවෝ නො වෙති. තේ කෝප්පයට, බුලත්විටට, රැවටී කේලාම් බිණීමට තරම් මාගේ දරුවෝ ලාමක ද? දුසිරිත පිළිකුල් කරන මාගේ දරුවෝ සතර අගතියට වල්වෙත් ද, කියව දුව, මත්පැන් කිසිකලෙක දුටුවෙහි ද. දහම් රස මුව වැකෙද්දී දරුවන්ට කුමන මත්පැන් ද? මත් පැන් බොන්නන් සමඟ කුමන කතාවෙක් ද? මාගේ දරුවෝ යහපතක් සිතති යහපතක් කරති.

පණ්ඩිතයන් සෙවූ මා දරුවෝ මව අඳුනති. පියා අඳුනති. මවට කීකරු ය, පියාට අවනත ය, නුවණින් මව්පියන් යහපතෙහි හසුරුවති. උපස්ථාන කරති. මවට වඳිති. පියාට වඳිති. වැඩිහිටියන් සලකති. සත්‍යයට පුදති. යුක්තියට නැමෙති. දයාව පෙන්විය යුතු තැන ගලක් මෙන් දැඩිවෙති. නිරහංකාර ජීවිතයක් ගතකරති. පණ්ඩිත

දරුවෝ සංසුන් වූහ. දරුවෙනි, වරද දුටු තැන වරද බව පිළිගනිමු. වරදට සමාව අයදිමු. දරුවෙනි, අනුන් අයත් බර කුමට උසුලමුද. දරුවන්ට ශෝකයක් නැත. වියවුලක් නැත. නඩුවක් නැත. සමඟියට ආ වඩති. ලත්දෙයින් ප්‍රීතිවෙති. ''ඉරහඳ'' කඩාගැනීමට මහන්සි නො වෙති. ලැබුණු සැපත අනුන්ටත් බෙදාදෙති. කළගුණ සළකති. මාගේ දරුවෝ පරිත්‍යාගශීලී ය.

ආර්ය පියාණන් වහන්සේ දරුවන් ගේ සුවදුක් මගෙන් අසති. දරුවන්ගේ චරිතය අසති. දරුවන් කරන කියන දේ අසා සාධුකාර දෙති. ඉධ භික්ඛවේ එකච්චෝ හත්ථිරතනම්පි දස්සනාය ගච්ඡති අස්සරතනම්පි - පෙ- අනිප්පසන්තෝ. ඉදං වුච්චති භික්ඛවේ අනුස්සතානුත්තරියංති යන ස්වර්ණ වාක්‍යය මාගේ දරුවෝ සිහිකරති. මෙවැනි දැකීම ළාමක ය. ග්‍රාම්‍ය ය. අනාර්ය ය, අපිරිසිදු ය, අනර්ථ ය. මෙවැනි දැකීම් බලමින් නිවන් අත් පත් කරගන්නෝ ඇද්ද? මාගේ පණ්ඩිත දරුවෝ ආරාධනයක් නොලැබ නිකරුණේ නිවසින් පිට නොයති. නිකරුණේ වීථිවල තෙරපෙමින් අවමන් නො විඳිති. පියාණන් වහන්සේ ගේ මුහුණෙහි දැලි නො ගාවති. මාගේ දරුවෝ පැසසිය යුත්තක් ම කරති. පියාණන් බසට අවනතය හ. දුසිරිතට නිගා කරති. සුසිරිත ළගා කරති. දුසිරිත් වැපිරෙන සුසිරිත් දුරුවන සංවරය සඳහට ම කෙලෙසන ලාමක ගමන් නො යති. මාගේ දරුවන් ගේ චරිතය උද්දාම වූයේ පංචශීලයෙනි අටසිල් රකිමින් බඹසරව වෙසෙති. නුසුදුසු දෙයින් ඇස නො පිනවති. පසිඳුරන් අනිසි ලෙස පිණවීම දරුවෙනි ළාමක ය. මා ප්‍රිය දුව ප්‍රීතියෙහිදීත් කම්පා නොවෙව. දුකක් විඳින විටත් කම්පා නොවෙව. මාරයා දුටු විට

බිය නොවෙව. ලාමක දෙයින් ප්‍රීති නොවෙව. දිවියතත් පියාණන් වහන්සේට නොපොරොන්දුව වැඩ නො කරව.

''සබ්බදුක්ඛනිස්සරණ '' යන වැකිය සිහි කරනු. මාගේ දරුවෝ දකුම් අතුරෙන් උත්තරීතර බුදුපියාණන් වහන්සේ ම දකිති. විසිතුරු බැලීමට පියාණන් වහන්සේගෙන් අවසර ලැබුණත් පැකිලෙත්, දරුවෙනි නිවනට ම ළඟා වව්.

**''සබ්බේ සත්තා සුඛිතා හොන්තු ''**



අනිත්‍යං යෞවනං රූපම් ජීවිතං ද්‍රව්‍යසංචයඃ
ඓශ්වර්යං ප්‍රියසංවාසො මුහ්‍යෙත් තත්‍ර න පණ්ඩිතඃ
- හිතෝපදේශය

යොවුන් කම ද, රුව ද, දිවිය ද, දන රැස් කිරීම ද, ඉසුරු බව ද, ප්‍රිය අය හා එක් වී විසීම ද නිත්‍ය නැත. නුවණැත්තා එහි මුළා නොවන්නේ ය.



# නිදහස් ලංකා

**මහගම සේකර සූරීන් විසිනි**

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුට යි
ඒ පොළොවේ තෙද ඔද ගුණ
පුතුහට පිහිට යි
විහාර මහ මෑණිවරුන්
ඉපදුණු පොළොව යි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොව යි
රාසිහ මහසෙන් දෙවියන්
ඉපදුණු පොළොව යි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුට යි
මහ සෑ රන් කොත වැටලූ
ගන රන් එළිය යි
සිරිමා බෝ මැඩ සෙවණේ
සිහිලැල් සුළඟ යි
දළදා හිමි රැඳි විමනේ
බුදු රැස් දහර යි
හැම දා හැම දුක් දුරලා
පුතු සිත සනස යි



# තිපල්ලත්ථමිග ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.**

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර බදරිකාරාමයෙහි වැඩ වාසය කරන කල, කුඩා රාහුල තෙරුන් වහන්සේ වෙනුවෙන් මේ ජාතකය වදාළ සේක.

මෙම තිපල්ලත්ථමිග ජාතකය දෙසීමට මුල් වූයේ එක් කලෙක බුදුරජාණන් වහන්සේ අලව් නුවර, අග්ගාලව දේවාලයෙහි වැඩ වාසය කරන කල ඇති වූ ප්‍රශ්නයකි. බොහෝ භික්ෂූහු ද උපසම්පදා නො ලැබූ සාමණේරවරු ද භික්ෂුණීහු ද එහි දහවල පැමිණ බණ ඇසූහ. පසුව රාත්‍රි කාලයේ දී භික්ෂූහු හා උපාසකවරු බණ ඇසීමට පටන් ගත්හ. මෙසේ රාත්‍රි බණ ඇසීමට සැවොම පුරුදු වූහ.

බණ ඇසීමෙන් පසු වැඩි මහල් භික්ෂූහු තම කුටි වෙත වැඩම කළ අතර, බාල භික්ෂූහු මෙන් ම උපාසකවරු දාන ශාලාවෙහි ලැගුම් ගත්හ. නින්දට වන් උපාසකවරු ගොරවති, නින්දෙන් නැගිටිති, කියවති. භික්ෂූහු මෙම අප්‍රසන්න හැසිරීම ගැන බුදුරජාණන් වහන්සේට සැල කළහ. ඒ විට උන්වහන්සේ මෙලෙස සැවොම එක ම ශාලාවෙහි සැතපීම නො කළ යුතු යැයි ශික්ෂා පදයක් පැනවූහ. අලව් නුවරින් නික්ම බුදුරදහු පමණක් ඉන් පසු කොසඹෑ නුවරට වැඩියහ.

ඒ වනවිට උපසම්පදා නොලබා සිටි රාහුල තෙරුන් වහන්සේට මෙම ශික්ෂාපදය නිසා ප්‍රශ්නයක් මතු විය. ඒ අග්ගාලව දෙවොල් භූමියෙහි සැතපෙන්නට නො මැති වීම ය. නමුත් කුඩා රාහුල තෙරුන් වහන්සේ සංවර හා විනය ගරුක නිසාත් බුදුරජාණන් වහන්සේට ඇති ගෞරවය නිසාත් අනිත් භික්ෂූහු කුඩා ඇඳක් හා හිස තබන්නට සිවුරක් ලබා දුන්හ. රාහුල තෙරණුවෝ ද තම පියාණන් බුදු රජාණන් වහන්සේ වුවත් අවස්ථාවෙන් ප්‍රයෝජන නොගත්හ. සුව පහසු තැනක් ඉල්ලා නොසිටියහ. තමනට සුදුසු ස්ථානයක් සොයා ගත නොහැකි වූ රාහුල තෙරණුවෝ බුදු රජාණන් වහන්සේගේ වැසිකිළියට ගොස් සැතපෙන්නට තීරණය කළහ.

පසුදින හිමිදිරියේ ම වැසිකිළිය දොරකඩ දක්වා වැඩම කළ බුදුරජාණන් වහන්සේට දනෙන්නට රාහුල තෙරණුවෝ උගුර පෑදූහ.

"ඇතුළත සිටින්නේ කවරෙක් ද ? බුදුහු ඇසූහ.

"මම රාහුල " යනුවෙන් කුඩා තෙරණුවන් පැවසූ කල "රාහුල මෙහි සැතපී සිටියේ කුමක් නිසා ද " යනුවෙන් විමසූහ.

"ස්වාමීනී, සැතපෙන්නට තැනක් නොමැති නිසා මෙහි පැමිණියෙමි . ශික්ෂාපදය පැනවූ බැවින් ඒ අනුව භික්ෂූන් මෙන් ම මම ද කටයුතු කරන්නෙමි" යනුවෙන් පැවසූහ.

මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේට ධර්ම සංවේගයක් ඇතිවිය. ඒ රාහුල තෙරණුවනට මෙසේ වී නම් තවත් කුල දරුවනට මහණ වූ පසු කුමක් කළ යුතුදැයි උන්වහන්සේගේ සිතට නැගුණ බැවිනි. ඉන්පසු භික්ෂූ රැස්කරවා "ඇ රාහුල නිදාගත් ස්ථානය දන්නෙහිද ?" යනුවෙන් ඇසූහ. සැරියුත් තෙරණුවන් නො දන්නා බව පැවසූ කල, ඒ වැසිකිළියෙහි බව වදාරා, මෙම ශික්ෂාපදයෙන් භික්ෂූන් අපහසුතාව ලබන බව පැවසූ සේක. එම නිසා බුදුරජාණන් වහන්සේ නැවත ශික්ෂාපදයක් පැනවූහ.

එනම් භික්ෂූන් වහන්සේලා සමඟ උපසම්පදා නො වූවනට දින දෙකක් විසිය හැකි බවත්, තෙවන දිනයේ දී වාසය කිරීමට තැනක් සොයා දිය යුතු බවත් වදාළ සේක. පසු දිනෙක දම් සභාවට රැස් වූ භික්ෂූහු රාහුල තෙරණුවන් මුහුණ දුන් ප්‍රශ්නය ගැනත් උන්වහන්සේගේ සංවරශීලී බව, විනය ගරුකබව, හා යහපත් ගතිගුණ ගැන සාකච්ඡා කරමින් සිටියහ. සමහර භික්ෂූහු උන්වහන්සේ පරීක්ෂා කිරීමට සිතා ''ඉදල, කොස්ස නිසි තැන නො තබා ඇත්තේ කවුරුදැ''යි විමසූ විට, කුඩා රාහුල තෙරණුවෝ ''මම නො දනිමි'' යි පවසා එය සකස් කළහ. එවිට එහි වැඩි බුදුරජාණන් වහන්සේ රාහුල පෙර කල තිරිසන් ජාතියෙහි පවා විනය ගරුකව, බුද්ධිමත්ව කටයුතු කළ බව පැවසූ සේක.

ඈත අතීතයේ රජගහ නුවර මගධ රජුගේ කාලයෙහි බෝසතාණෝ මුව රජෙකුව ඉපිද මුව පිරිවර සමඟ වනයේ වාසය කළහ. මුවරජුගේ නැගණිය, තම කුඩා පුතු සමඟ පැමිණ ඔහුට වනයේ විසීමට ඇවැසි උපදෙස් හා උපායන් උගන්වන ලෙස තම සොහොයුරාගෙන් ඉල්ලා සිටියාය. ඉගෙනීමට නියම කළ වේලාවට සැම විට ම පැමිණි මුව පැටියා මැනවින් ඉගෙන ගත්තේය. නමුත් දිනෙක වැද්දෙකු ඇට වූ උගුලක අසු වූ බැවින් මව් මුව දෙන හඬා වැළපුණි. මුව පුතු බේරෙන්නට හොඳින් උපායන් දන්නා නිසා බුද්ධිමත් ව කටයුතු කරනු ඇතැයි මුව රජු ඇයට පැවසීය.

මුව පැටවා ද වැද්දා වරපට ලිහීමට පැමිණෙන තුරු මළ මුවෙකු මෙන් සිටියේ ය. කපුටෝ ද නිළ මැස්සෝ ද රැවටුණහ. වැද්දා වටපට ලිහන විට ම තම මව වෙත වේගයෙන් දිව ගියේ ය. ඉතා බුද්ධිමත් ව කටයුතු කළ නිසා මුව පුතුගේ ජීවිතය බේරුණි.

එකල මුව පුතු මෙකල රාහුල තෙරුන් වහන්සේය. මෑණියෝ උපුල්වන් තෙරණියයි. මුව රජු බුදුරජාණන් වහන්සේ ය.

සංවරය, විනය ගරුකබව මෙන් ම බුද්ධිමත් බව අප ජීවිතයට ඇවැසි බව මෙම ජාතකය අපට කියා දෙයි.



# කතුර සහ ඉදිකටුව

**"මුතු සීයා" විසිනි**

දරුවනේ, මීට කලකට පෙර ඔබ කියවන මේ ,බෞද්ධ ළමයා, සඟරාවෙන් ම ඔබ පාසලේ දී ලිවීමේ කටයුතුවල දී ප්‍රයෝජනයට ගන්නා උපකරණ දෙකක් ගැන මා කීවා මතක ඇතැයි සිතමි. ඒ පැන්සල සහ මකන කෑල්ල යන දෙක ගැන.

අද මා කියන්නට යන්නේ විශේෂයෙන් ඔබට වඩා ඔබ ගේ මවුතුමිය මැහුම්-ගෙතුම් කටයුතු වලදී නිතර ප්‍රයෝජනයට ගන්නා ඉදිකටුව සහ කතුර යන දෙක ගැන. අපි හොඳට පරීක්ෂා කර බලමු මේ උපකරණ දෙකින් ඉටු වන කාර්යයන් මොනවාද කියා.

ඒ දෙක අතුරින් කතුරෙන් කැරෙන්නේ කඩදාසියක් හෝ රෙද්දක් හෝ කපා වෙන් කිරීමයි. එකට බැඳී තිබුණ කඩදාසියක් හෝ රෙද්දක් වෙන් කිරීම යි. ඒ අතර ඉදිකටුවෙන් වෙන් ව තිබුණ රෙදි කැබලි දෙකක් එක් කිරීමයි, එකට මැසීමයි.

මේ උපකරණ දෙකෙන් ඉටු වන කාර්යයන් දෙක ගැන සිතා බලන විට ඔබට සිතෙනුයේ මොන උපකරණයෙන් ඉටු වන කාර්යය යහපත් කියා ද? වෙන් කිරීම ද ? එක් කිරීම ද ? මැහුම්-ගෙතුම්වල දී නම් මේ උපකරණ දෙක ම ප්‍රයෝජනවත් වන බව ඉතා ම පැහැදිලියි.

කවර සමාජයක් හෝ ජාතියක් හෝ ආගමක් හෝ දේශයක් හෝ ගැන සිතා බැලීමේ දී, කිසියම් ම අරමුණක් මත, භේද-භින්න වීම, එම ඒකකයට යහපත් ප්‍රතිඵල ගෙන නොදෙන බව ඉතා ම පැහැදිලි ය. සාමයෙන් යහතින් සමගියෙන් වසන පවුලකට වුව කෙනෙකු ගේ යහපත, දියුණුව නොරුස්සන (ඊර්ෂ්‍යාවෙන් යුත්) පුද්ගලයෝ විරසකක් ඇති කිරීමට යත්න දරති, උපක්‍රම යොදති (එය කතුරෙන් කැරෙන කාර්යයයි).

කුඩා කල සිට ම ඔබ යත්න දැරිය යුත්තේ ඉදිකටුවෙන් ඉටු වන කාර්යය කිරීමට ය, වෙන් වූ ඒකක දෙකක් එක් කිරීමට ය. ඔබ මිතුරන් දෙදෙනෙක් විරසක ව සිටිත් නම්, විරසක වීමට හේතුව සොයා බලා එය විසඳිය යුතු ය. ඔවුන් දෙදෙන එක් කළ යුතු ය. එම යහ ගුණය කුඩා කල සිට ම පුරුදු පුහුණු කළ හොත් අනාගතයේ දී නියම පුරවැසියන් වශයෙන් විශාල මෙහෙවරක් ඉටු කිරීමට ඔබට හැකි වනු ඇත (එකට එක් කිරීම ඉදිකටුවේ කාර්යයයි).

මට මේ අවස්ථාවේ දී කුඩා ජනකථාවක් මතක් වෙනවා. ඒ මෙසේ යි:- එකමත් එක රටක සුනඛයන් දෙදෙනෙකු ඉතා ම මිත්‍ර ව සුහද ව එකට වාසය කළා. සාමාන්‍ය සුනඛයන් ගේ පුරුද්ද නිතර පොරකෑම නිසා, කල් යාමේදී සාමයෙන් එකට ජීවත් වීම මුන් දෙදෙනාට ද එපා වුණා. ඒ නිසා ආරාවුලක් ඇති කර ගෙන පොර කන්නට එකෙක් ගලක් අර ගෙන ඇවිත් අනෙකාට කීවා, මේ ගලේ අයිතිය ගැන අපි රණ්ඩු කරමු ය කියා. එසේ සිතාගෙන උං කීවා ,මේ ගල මගේ, කියා. ආරාවුල් කර ගන්නට අකැමැති අනෙකා කීවා, ,උඹේ නම් උඹ ගනින්, කියා. එ තැනින්ම එම ආරවුල කෙළවර උණා. ඉදිරියටත් උන් දෙදෙන සමගියෙන් වාසය කළා.

ඉන්දීය සමාජයේ රජ කුමරකුට ශිල්ප උගන්වන විලාසයෙන් සංස්කෘත ග්‍රන්ථයක් ,පංචතන්ත්‍රය, නමින් සකස් කර තිබෙනවා. ඒ ග්‍රන්ථයේ අනුවාදයක ස්වරූපයෙන් විදුලකර සරසවියේ

උපකුලපති ව සිටි යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමියන් ,වනකථා හෙවත් මිතුරන් කෙටවීම, නමින් ග්‍රන්ථයක් රචනය කර තිබෙනවා. කැළයේ සතුන් යොදා ගනිමින් උපදේශාත්මක සරළ කතා මගින් භේද වීමේ විපාකය පෙන්වා දෙනවා.

බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයන් වහන්සේ (විනයධර සහ ධර්මධර භික්ෂූන් වහන්සේ දෙපිරිසක්) අතර ඉතා ම සුළු කරුණක් මත අසමගියක් ඇති වූ බවත් එය සමත් කර ගන්නා තෙක් බුදුන් වහන්සේ පාරිලෙය්‍ය ඇතා ගේ උපස්ථාන ලබමින් පාරිලෙය්‍ය වනයේ හුදෙකලා ව වස් විසූ බවත් බුද්ධ චරිතයේ සඳහන් වෙනවා. වට්ටක, ලටුකික වැනි ජාතක කථාවලින් ද පෙන්වා දෙන්නේ සමගි ව විසීමේ යහපත් ප්‍රතිඵලය යි.

දරුවනේ, අපට දැන් අවශ්‍ය ව ඇත්තේ විවිධ මති-මතාන්තර ඇති කර ගෙන වෙන් වන සමාජයක් නො වේ. ඒ වෙන් වීමට තුඩු දෙන අරමුණු ඉවත් කර ගනිමින් අමතක කරමින් සමගි වන සමාජයකි. කුඩා වේයා ගැන සිතන්න. උන් ගේ සමගිය නිසා ඉතා විශාල තුඹසක් සාදනවා නේද? මී මැසි පොදිය තම රැජින වට කර ගනිමින් විවිධ කාර්ය බෙදා ගෙන මී වදයක් තනා මී පැණි නිපදවමින් අපට ඉතා වැදගත් ආදර්ශයක් දෙනවා නේද?

එහෙයින් දරුවනේ, මත භේදයට තුඩු දෙන කිසි ම කරුණකට ඇඳෙන්න එපා. මැදිහත් විය යුත්තේ ඔබට එය විසඳීමට හැකියාවක් ඇත් නම් පමණි. නැතහොත් වළකින්න. ඒ ලෙස සමගි වී සිටීමේ ආනිශංසත් භේද භින්න වී සිටීමේ ආදීනවත් මැනැවින් වටහා ගෙන කටයුතු කරමින් වැඩිහිටියන් බවට පත් වුව හොත් ඉදිරියේ දී නැණවත් ව කටයුතු කරන යහපත් සමාජයක් අපට අපේක්ෂා කළ හැකි වනු ඇත. කතුරක් නො වන්න. ඉදිකටුවක් ම වන්න.

ඔබට තෙරුවන් සරණයි !



# මලක සුවඳ

**සිරි වජිරාරාමවාසී පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි.**

ආත්තම්මේ........ ආත්තම්මේ........ මට කවියක් කියල දෙන්නකෝ..........

මගෙ පුතා එහෙනං අර ගහ යට වාඩිවෙන්නකෝ මම කවියක් කියල දෙන්න. හොඳට දැන් අහගන්න.

බුදුහාමුදුරුවන් ඉස්සර වඩිනකොට
මම හිටියනං එනවිට කැළයට දරට
වනමල් නෙළා අතුරා සිරිපතුල වට
වැඳ වැටෙනවා නොගොහින් ගෙට වරුවකට

එතකොට මේ මල් අතර ලස්සනම මල මොකක්ද?

මේ මල් හැම එකක්ම වගේ ලස්සනයි. ඒත් නෙළුම් මල තමා ගොඩක් ම ලස්සන මල. බොහො ම පියකරු වටින මලක්

ඇයි එහෙම කියන්නේ ආත්තම්මෙ ?

මගෙ පුතේ, නෙළුම් මල පිපෙන්නෙ කොහෙද ?

ම්ම්ම්ම්..........මම හිතන්නෙ මඩ වළක.

හරියට ම හරි

ඉතින් මඩ තියෙන වතුරෙ හැදුණට ඒ නෙළුම් මල මඩ ගාගෙනද පිපෙන්නෙ ?

නෑ ආත්තම්මෙ, මඩයි වතුරයි දෙක ම පහුකරගෙන උඩට ඇවිත් පිපෙනවා.

ඉතින් පුතේ මෙහෙම ලස්සනට පිපෙන නෙළුම් මලේ පෙති සීයක් තියෙනවා. ඒ වගේම මේ මලේ සුවඳට අර පහළ තියෙන මඩ වතුර වළේ ගඳ දැනෙන්නෙත් නෑ සමනල්ලු මී මැස්සො මේ සුවඳට ඇදිලා එනවා.

ඔය කින්නෙ ඇත්තමද ? ඒත් අපි එදා පන්සල් ගිහින් ගත්ත නෙළුම් මල් මිටිය එච්චර සුවඳ නැහැනෙ?

කොච්චර නෙළුම් මල් සුවඳයි කිව්වත් මම නම් හිතුවෙ නෙළුම් මල් සුවඳ නැහැ කියලයි.

නෑ මගෙ පුතේ, ඒ මල්වල සුවඳ දැන් දැන් අඩුවෙලා ගිහින්. මේ පරිසරය දැන් ගොඩක් වෙනස් වෙලා...... ගහකොළ, සතාසීපාවා, මේ හැමදෙයක් ම දැන් ටික ටික වෙනස්වෙලා මේ මිනිස්සු කරන නරක වැඩ නිසා

අනේ........ආත්තම්මා මොනවා කියනවද කියලා මට නම් තේරෙන්නේ නෑ...

පුතේ ............

මේ ලෝකෙ බොහෝ දේ තියෙනවා. ගස් කොළං, වැව් ගංගා, වනසත්තු, කුරුල්ලෝ, සමනල්ලු, මිනිස්සු.......මේ විදිහට තව බොහෝ දේ තිබෙනවා.

ඉතින් මේ හැමදේම අතරින් මිනිසා කියන සතා විශේෂ කෙනෙක්. ඒකට හේතුව මිනිසාට හිතන්නට පුළුවන් හැකියාවක් තියෙනවා. ඉතින් මිනිස්සු හිතින් හිතලා නොයෙක් අලුත් අලුත් නිර්මාණ මේ ලෝකයට බිහිකරනවා හරියට රූප පෙට්ටිය, කථා පෙට්ටිය වගේ නව නිර්මාණ.

මේ විදිහට නිර්මාණය කළ බොහෝ දේ අතරින් සමහර දේ මේ පරිසරයට අහිතකර වෙනවා. ඒ වගේ නිර්මාණ නිසා අප අවට තියෙන පරිසරයත් විනාශ වෙලා යනවා. ඒ නිසා තමයි අර කලින් කිව්ව මල් වල සුවඳ ටික ටික අඩුවෙලා ගිහින් තියෙන්නේ.

එතකොට ආත්තම්මෙ මිනිසා නිසා ම නේ ද මේ පරිසරය විනාශ වෙන්නේ.... ඉතින් එහෙම කරන කොට එයාලට පව් සිද්ධ වෙන්නේ නැත්ද?

හොඳ ප්‍රශ්නයක් පුතා ඇහුවෙ.

අපි පුතේ අද හවහට පන්සලට ගොහින් පොඩි හාමුදුරුවන්ගෙන් පුතා අහපු ප්‍රශ්නයට උත්තර අහගමු.

ඒ උත්තමයට පුළුවන් පුතාට මටත් වඩා හොඳට මේ ගැන විස්තර කරල දෙන්න.........

ලබන කලාපයට ......